# සිතක් විමුක්තිය පිණිස සකස්වීමට...



## කල්‍යාණ මිත්‍ර ආශ්‍රය.

කල්‍යාණ මිත්‍රයන් සිටින විට කල්‍යාණ මිත්‍රයන් ආශ්‍රය කලයුතුය. කල්‍යාණ මිත්‍රයන් ඇසුරෙන් පහත සියලු කාරණා සම්පූර්ණවේ.

## සීලය.

ආචාරගෝචර සම්පන්නව කුඩා වරදේ නමුත් බය ඇතිව, සමාදන්වූ සීලය රැකීම.

## දසකථා.

දෙතිස් කථාවෙන් වෙන්ව අල්පේච්ඡකථා ආදී දසකථාවලින් යුක්තවීම.

## ආරද්ධවිරිය.

අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශල ධර්මයන්ගේ ඇතිවීම පිණිස ඇරඹූ පරාක්‍රම වීර්‍ය.

## ප්‍රඥව.

සංස්ඛාරයන්ගේ ඇතිවීම නැතිවීම දක්නාවූ ආර්‍යය කලකිරීමකින් යුක්තවූ මනාව දුක් ක්ෂය කරන්නාවූ ප්‍රඥව.

**යන ධර්මයන්හි පිහිටා...**

**රාගය ප්‍රහාණය පිණිස අසුභය**

**ව්‍යාපාදය ප්‍රහාණය පිණිස මෛත්‍රිය**

**විතර්ක සංසිඳීම පිණිස ආනාපානසතිය**

**අස්මිමානය දුරුවීම පිණිස අනිත්‍යසංඥව**

**වැඩිය යුතුය...**

අනිත්‍යසංඥව ඇති කෙනාට අනාත්මසංඥව පිහිටන්නේය. අනාත්මසංඥව ඇති කෙනා අස්මිමානය සහමුලින්ම දුරුකිරීමට සමත්වේ... මේ ජීවිතයේදීම නිවනට පැමිණෙයි...

මේඝීය සුත්‍රයෙනි.

ධර්ම දානය...
උල්පත්කන්ද අරණ්‍ය සේනාසනය
හන්තාන - මහනුවර.